**IPRC/16/60**

# කථාවත්ථුප්පකරණයේ පුද්ගල කථා පරිච්ඡේදයේ සංගෘහිත වාද ක්‍රමය පිළිබඳ අධ්‍යයනයක්

දිල්ශාන් මනෝජ් රාජපක්ෂ[1*]

බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන පාර්ශ්වයෙහි ලා අවධනය යොමු කෙරෙන මෙම පර්යේෂණයේ දී මූලික ව යොමු වන්නේ කථාවත්ථුප්පකරණය කෙරෙහි වන අතර එහි ද පුද්ගල කථා පරිච්ඡේදයේ සංගෘහිත වාද ක්‍රමය කෙරේ සීමා වෙමින් අධ්‍යයනය සිදු කෙරේ. ඒ අනුව කථාවත්ථුප්පකරණයත් එහි අටුවාවත් මේ සම්බන්ධයෙන් රචනා වී ඇති ද්විතීයික මූලාශ්‍රයත් පරිශීලනය කෙරේ. ක්‍රි.පූ. 255 දී රචිත කථාවත්ථුප්පකරණය නම් වූ පාලි ආභිධම්මික ග්‍රන්ථයේ එන සංවාද සොක්‍රටික ක්‍රමය ද ඉක්මවා යන වඩාත් සාර්ථක අපෝහක ක්‍රමයක් විශද කරන අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකි ය. එමෙන් ම කථාවත්ථුප්පකරණයෙහි අඩංගු තාර්කික ක්‍රමවේදය පිළිබඳ ව අධ්‍යයනය කරන විට මොග්ගලීපුත්ත තිස්ස හිමියන් අනුගමනය කරන තාර්කික ක්‍රමවේදය සමකාලීන සමාජයේ හා බෞද්ධ උගතුන් අතර ජනප්‍රිය ව පැවති එකක් බවට කිසිඳු සැකයක් නැත. කෙසෙ 'නමුත් මෙහි දී මොග්ගලීපුත්තතිස්ස හිමියන්ගේ ප්‍රයත්නය වූයේ කිසිඳු තර්ක ක්‍රමයක් අනුගමනය නො කර දෙපක්ෂයට ම තම තමන්ගේ භාෂාව යොදා ගැනීමට අවසර තබා එයින් කවරක් බුදුන් වහන්සේගේ දර්ශනය හා ගැළපෙන්නේ ද? යන්න පැහැදිලි කිරීමට යි. ඒ බව ථෙරවාදයෙන් මිථ්‍යා දෘෂ්ටි ලෙස බැහැර කෙරුණ ද කථාවත්ථුප්පකරණ විවාදයේ දී ථේරවාදියා හෝ පුද්ගලවාදියා ජයග්‍රහණය හෝ පරාජය භාරගත් බවක් සඳහන් නො කිරීමෙන් ද පැහැදිලි වේ.

කථාවත්ථුවේ මතවාදයන් සියයකට වඩා විග්‍රහ කරන ලද නමුත් ඒවා අතර ඇත්තේ **පුද්ගලවාදය, සර්වාස්තිවාදය, ලෝකෝත්තරවාදය** යන ප්‍රධාන මතවාදයන් තුනක් පමණකි. එම මතවාද අතරින් පුද්ගලවාදය කෙරේ කථාවත්ථුප්පකරණයෙහි සුවිශේෂ අවධානයක් යොමු වන්නේ එය පළමු කොට ම පළමු පරිච්ඡේදයේ දී ම දක්වන නිසා පමණක් ම නොව පරවාදී-සකවාදී විවාදය පුළුල් ලෙස හා සම්පූර්ණ ලෙස කථාවත්ථුප්පකරණයෙහි භාවිත වන තර්ක ක්‍රමවේද සියල්ල අන්තර්ගත වන බැවිනි. කථාවත්ථුප්පකරණයේ අනෙකුත් පරිච්ඡේදවල පොයාල ක්‍රමයට දක්වා ඇති විවාදය සම්පූර්ණ විස්තර සහිත ව දක්වෙන්නේ පුද්ගලකථා පරිච්ඡේදයේ අන්තර්ගතය තුළ වන බැවිනි. පුද්ගල කථා පරිච්ඡේදයේ සකවාදී පරවාදී විවාදය තුළ තර්ක ඉදිරිපත් වන අයුරු අදාළ සංකල්පය පිළිබඳ විග්‍රහයක් පදනම් කරගෙන තර්ක කිරීම, සූත්‍රාගත කරුණු උපුටා දක්වමින් තර්ක කිරීම හා පරිච්ඡේදය අවසන් වන විට සංකල්ප පිළිබඳ දුර්මත දුරු කිරීම සඳහා පද සංකලනය තුළින් තර්ක කිරීම යනාදි ලෙස තුන් ආකාරයකින් දැකිය හැකි ය.

***ප්‍රමුඛ පද:*** *කථාවත්ථුප්පකරණය, තර්කය, පුද්ගලකථා පරිච්ඡේදය, පුද්ගලවාදය, මොග්ගලීපුත්තතිස්ස හිමි*

[1] කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව *dilshanmanojrajapaksha@gmail.com